# ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇත කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

(අ). ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16 — සේවා කාලය වර්ෂයක් සම්පූර්ණ වන සේවකයන් සඳහා පාරිතෝෂික වෙන්කිරීම සිදුකල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

(ආ). ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24

(I). රාජ්‍ය ප්‍රදානයන් සම්බන්ධව අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය ප්‍රාග්ධන ප්‍රවේශයද, ආදායම් ප්‍රවේශයද යන්න සහ ස්ථාවර වත්කම් සම්බන්ධ ප්‍රදානයන් සඳහා කුමන ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබුණේද යන්න ගිණුම් සමග හෙළිදරව් කර නොතිබුණි.

(II). 2010 වර්ෂයේදී සහ 2011 වර්ෂයේදී අත්පත් කරගත් රු.13,498,416 ක් වටිනා වත්කම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ක්ෂය ලෙස හඳුනාගෙන ඇති රු.1,342,737 ක මුදල හා 2011 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලද රු.10,728,295 ක් වටිනා මෝටර් රථ වෙනුවෙන් ක්ෂයවීම් ලෙස හඳුනාගෙන ඇති රු.1,463,574 ක මුදල වර්ෂයේ ආදායමට ගෙන නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ). සමාලෝචිත වර්ෂයේ කාර්යාලය වැඩිදියුණු කරීම වෙනුවෙන් වැයකළ රු.1,529,024 ක් සඳහා මාස 05 ක කාලයකට අදාළ ක්ෂයවීම් රු.31,855 ක් වුවත්, ඒ වෙනුවෙන් රු.76,451 ක් ක්ෂයවීම් ලෙස ලියාහැර තිබුණි.

(ආ). 2010 වර්ෂය වෙනුවෙන් 2010 දෙසැම්බර් මාසය තුළදී ලද පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් රු.850,000 ක් සහ රු.2,900,000 ක් 2011 වර්ෂයේ ලද ප්‍රදාන ලෙස සලකා ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු.850,000 ක අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ). තරඟකාරී ගිවිසුම් පර්යේෂණ වැඩසටහන 2010 දෙසැම්බර් 31 දිනට අවසන් වී තිබුණද, මේ සඳහා ලබාදුන් අත්තිකාරම් වලින් රු.833,541 ක් 2012 පෙබරවාරි 29 දින තෙක්ම පියවා නොතිබුණි.

(ආ). විදේශ පාඨමාලා සම්පූර්ණ නොකළ නිලධාරීන් 04 දෙනෙකුගෙන් ගිවිසුම් ප්‍රකාර අයකරගත යුතු රු.1,986,355 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වනතුරු අයකරගෙන නොතිබුණි.

### 1.2.4 නොසැසඳුනු පාලන ගිණුම්

2011 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ වල ශේෂය රු.3,651,977 ක් වුවද සභාව විසින් පිළියෙල කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.3,028,332 ක් ලෙස දක්වා තිබුණි.

### 1.2.5 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම පිළිබඳ විස්තර |
|---|---|---|
| (අ). | I. මු.රෙ. 104 (3), (4) | 2011 ඔක්තෝබර් 16 දින සභාවේ වාහනයක් අනතුරට ලක්වී තිබුණද ඒ සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් හා පූර්ණ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | II. මු.රෙ. 396 | මාස 06 ක් ඉක්මවූ ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ රු.16,995 ක් වටිනා චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | III. මු.රෙ. 454 | ගබඩා භාණ්ඩ සම්බන්ධයෙන් බඩු ලේඛන පොතක් පවත්වා නොතිබුණි. |
| | IV. මු.රෙ. 756 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2012 පෙබරවාරි 28 දක්වාම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ). | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහනවල අභ්‍යන්තර අලුත්වැඩියා සම්බන්ධයෙන් සුදුසුකම්ලත් නිලධාරියකුගේ නිර්දේශය ලබා ගැනීමෙන් තොරව අවස්ථා 4 කදී රු.270,545 ක් වූ අලුත්වැඩියා සම්බන්ධයෙන් ගෙවීම් කර තිබුණි. |
| (ඇ). | 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | 7:11:1 | ලංසු ඇගැයීම අවසන් කල වහාම, ප්‍රසම්පාදන අත්පොතේ සඳහන් කර ඇති ආකෘතිය අනුව, තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් ලංසු ඇගැයීම් වාර්තාවක් පිළියෙල කර, සියලුම සනාථ කිරීමේ ලේඛන සහිතව එම වාර්තාව ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කල යුතු වුවත් රු.1,911,280 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.8,902,093 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.8,140,962 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.761,131 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණ. මෙම වැඩිවීම සඳහා පරිපාලන වියදම් රු.5,396,568 කින් වැඩිවීම බලපා තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව, 2011 දෙසැම්බර් 31 දිනට ආයතනයේ මූල්‍ය ව්‍යුහය 2010 දෙසැම්බර් 31 දිනට පැවත තත්ත්වය හා සසඳා පහත දක්වා ඇත.

| සම්පත් | දෙසැම්බර් 31 දිනට | | වෙනස් වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | 2011 | 2010 | |
| | රු. | රු. | % |
| සමුච්චිත අරමුදල | 33,575,937 | 23,125,038 | 45 |
| අතිරික්ත / (ඌනතාව) | (17,043,055) | (6,684,091) | 155 |
| | 16,532,882 | 16,440,947 | |
| ජංගම නොවන වගකීම් | 24,273,801 | 9,326,902 | 160 |
| ජංගම වගකීම් | 2,536,067 | 1,453,768 | 74 |
| | 43,342,750 | 27,221,617 | |
| උපයෝජනය | | | |
| ස්ථාවර වත්කම් | 32,223,158 | 16,040,330 | 101 |
| ජංගම වත්කම් | 11,119,592 | 11,181,285 | 1 |
| | 43,342,750 | 27,221,615 | |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුමේ පොදු කොන්දේසි 4(1) ප්‍රකාරව ව්‍යාපෘතියක් අවසන් කර තෙමසක් ඇතුළත එහි අවසන් වාර්තාව විධායක අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළයුතු වුවද, 2005 සිට 2008 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව අවසන් වාර්තා 27 ක් ඉදිරිපත් කර නොතිබුණි.

### 3.2 කාර්ය මණ්ඩල පරිපාලනය

අනුමත කාර්ය මණ්ඩලය 31 ක් වුවද , 2011 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 21 වූයෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 10 ක් බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය

### 4.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පී/එෆ්/පීඊ/21 හා 2002 මැයි 24 දිනැති රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය අනුව මුල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත්, 2011 වර්ෂයට අදාල මුල්‍ය ප්‍රකාශන මාස 03 ක් ප්‍රමාද වී 2012 මැයි 31 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය රේඛීය අමාත්‍යාංශය විසින් සිදුකරනු ලැබුවද අභ්‍යන්තර විගණන සැලැස්ම හා විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි.

### 4.3 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2:1 ඡේදය ප්‍රකාර සභාව සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

සභාව විසින් 2010 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2012 අගෝස්තු 31 වන විටද පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 4.5 අයවැය පාලනය

සභාවේ ප්‍රධාන කාර්යයන් 13 ක් සඳහා 2011 වර්ෂයේදී ඇස්තමේන්තු කළ මුදල රු.21,345,679 ක් වුවත් සත්‍ය වශයෙන් වියදම් කළ මුදල රු.11,867,834 ක් විය.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයා වෙත යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ). ව්‍යාපෘති පරිපාලනය
(ආ). වාහන පරිපාලනය
(ඇ). ස්ථාවර වත්කම්